2012.09.03

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
දිස්ත්‍රික් සමෘද්ධි සහකාර කොමසාරිස් / දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම් / ප්‍රාදේශීය සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,
සමෘද්ධි සම්බන්ධීකරණ නිලධාරීන්,
සමෘද්ධි කළමණාකරුවන් සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

ජීවනෝපාය චක්‍රීය අරමුදල මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

ජීවනෝපාය චක්‍රීය අරමුදල මගින් සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන්ට ජීවනෝපාය ව්‍යාපෘති සඳහා ණය ලබාදීමේ දී අනුගමනය කළ යුතු නිර්නායක සහ පවත්වා ගෙන යායුතු ගිණුම් ක්‍රියාවලිය හා ඊට අදාල පොදු උපදෙස් පහතින් ඉදිරිපත් කරමි.

චක්‍රීය අරමුදල මගින් ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ණය ලබාදීමේ දී අනුගමනය කළ යුතු නිර්නායක

1. ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ කෘෂි , සත්ත්ව පාලන හා ධීවර , කර්මාන්ත, අලෙවි හා සේවා යන ක්ෂේත්‍ර යටතේ ව්‍යාපෘති ආරම්භ කිරීමට කැමැත්තක් දක්වන සමෘද්ධි ප්‍රතිලාභීන් හෝ අඩු ආදායම්ලාභීන් තෝරා ගත යුතු අතර ඒ සඳහා සමෘද්ධි සමිතියේ දී යෝජනා ස්ථිර වී වාර්තා ගත විය යුතුය.

2. වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරී , ව්‍යාපෘති කළමණාකරු (ව්‍යාපෘති කළමණාකරු නොමැති අවස්ථාවකදී ව්‍යාපෘති සහකාර) විසින් සෑම ව්‍යාපෘතියක් වෙනුවෙන් ම අවශ්‍ය අවස්ථාවන්හිදී විගණනය සඳහා ඉදිරිපත් කිරීමට හැකි වන අයුරින් මූලික කරුණු සියල්ලම අඩංගු කෙටි ව්‍යාපෘති වාර්තාවක් සකස් කළ යුතු වේ.

3. අදාල ව්‍යාපෘති වාර්තා සකස් කර කලාප කළමණාකරුගේ නිර්දේශය ලබාගෙන මහා සංගම් කළමණාකාර අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබා ගත යුතුය.

4. ව්‍යාපෘති වෙනුවෙන් ලබාදෙනු ලබන උපරිම මුදල රු.40,000/= ක් වන අතර එය මුදල්මය වශයෙන් ලබාදිය යුතුය. එහෙත් ව්‍යාපෘතියේ සාර්ථකත්වය මත භාණ්ඩ මිලදී ගැනීම අවශ්‍ය වන්නේ නම් පමණක් සමෘද්ධි සංවර්ධන නිලධාරී හා සමෘද්ධි කළමණාකරුවන් මැදිහත් වීමෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර අදාල මිලදී ගැනීම් සිදු කළ යුතුය. එහිදී හැකි සෑම විටම භාණ්ඩ මිලදී ගත් ආයතනයට වෙක්පතක් මගින් ගෙවීම් කළ යුතුවේ. මෙහිදී ප්‍රතිලාභියාගේ කැමැත්ත ප්‍රකාශ කල ලිපියක් ගෙන ගොනු කර තබන්න.

5. ලබා ගත් ණය මුදල අයදුම්පත්‍රයේ සඳහන් ව්‍යාපෘති අවශ්‍යතාවය වෙනුවෙන් වැය කර ඇත්ද යන්න පිළිබඳව පසු විපරම් කිරීම වසමේ සමෘද්ධි සංවර්ධන නිලධාරී , කලාප කළමණාකරු , ව්‍යාපෘති කළමණාකරු සහ මහා සංගම් කළමණාකාර අධ්‍යක්ෂකගේ මූලික රාජකාරී වගකීමක් වන අතර මෙය පාලක මණ්ඩලයේ ද වගකීමකි. තවද ගම්මාන සමිති රැස්වීම් වලදී මෙම ව්‍යාපෘති පිළිබඳව ප්‍රගතිය සාකච්ඡා කළ යුතු වේ.

6. ලබාදෙන ණය මුදල වෙනුවෙන් සහන කාලය මාස 03 ක් වන අතර වාර්ෂිකව 5% ක පොලියක් සහිතව මාසික වාරික 10 සිට 15 කින් මුළු මුදලම ආපසු අයකර ගත යුතුය. ලබා ගන්නා පොලිය සමෘද්ධි බැංකුවේ ආදායමක් වනු ඇත. සහන කාලය සඳහා පොලිය අය කළ යුතු නොවේ.

   6.1 රු. 20,000/- දක්වා සම මාසික වාරික 10 කින් ද

   6.2 රු. 20,001/- සිට රු. 40,000/- දක්වා සම මාසික වාරික 15 කින් ආපසු අයකර ගත යුතුය.

   නියමිත අයුරින් වාරික නොගෙවන්නේ නම් ඒ සඳහා අතපසු කරන වාරිකයකට 1% දඩ පොලියක් අයකර ගත යුතු වේ. අදාල දඩ පොලිය ලද ආදායම් - මිශ්‍ර ගිණුමට බැර කර ගිණුම් තබන්න. (ගෙවිය යුතු නියමිත දිනය පසුවී දින 07 කට පසුව වාරික ගෙවීමේ දී)

7. ව්‍යාපෘතිලාභීන් තෝරා ගැනීමට පෙර සෘජු ප්‍රතිපාදන හෝ බැංකු ණය පැහැර හැර ප්‍රතිලාභීන් තෝරා ගැනීම නොකල යුතු අතර , ලබා ගත් ණය මුදලක් තව දුරටත් අයවෙමින් පැවතියද බැංකු කළමණාකරු එම ව්‍යාපෘතිය පිළිබඳව සෑහීමකට පත් වේ නම් ඔවුන් ව්‍යාපෘති ගැන්වීම සඳහා තෝරා ගත හැකිවේ.

8. ව්‍යාපෘති පසු විපරම් කිරීමේ දී එම අදාල නිලධාරීන්ට පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි වන අයුරින් ආපසු ගෙවීම් සිදු කිරීම සම්බන්ධයෙන් තොරතුරු ව්‍යාපෘතලාභියා ළඟ ද තබා ගැනීමට උපදෙස් දිය යුතු අතර අදාල නිළධාරීන් විසින් වාරික අයකරගත් බවට එහි අනු අත්සන් යොදා තිබිය යුතු වේ.

9. ණය අයදුම් පත්‍රය නිසිලෙස සම්පූර්ණ කරගත යුතු අතර මුදල් ලබා දෙන අවස්ථාවේදී ප්‍රතිලාභියා සමඟ කලාප කළමණාකරු ගිවිසුම් ගත වීම අනිවාර්ය වේ. (අදාල ණය අයදුම්පත්‍රය ඇමුණුම් අංක 01 මගින් සහ ගිවිසුම් පත්‍රය ඇමුණුම් අංක 02 මගින් මේ සමඟ ඉදිරිපත් කර ඇත.)

10. අවශ්‍ය අවස්ථාවන්හිදී ඉදිරිපත් කිරීමට ව්‍යාපෘති වල ප්‍රගතිය දැක්වෙන සංඛ්‍යාත්මක දත්ත / ඡායාරූප / සී. ඩී. තැටි ආදිය සමෘද්ධි මහා සංගමයේ එක් රැස් කර තබාගත යුතුවේ.

11. වක්‍රීය අරමුදල මගින් ණය ලබාදීම සම්බන්ධයෙන් මාසික වාර්තා කලාප කළමණාකරු , මහාසංගම් කළමණාකාර අධ්‍යක්ෂ / මූලස්ථාන කළමණාකරු , දිස්ත්‍රික් ආදායම් උත්පාදන කළමණාකරු විසින් සකස් කළ යුතු අතර අදාල මාසයේ දිස්ත්‍රික් සාරාංශ වාර්තාව ඊළඟ මාසයේ 15 වන දිනට ප්‍රථම ලබාදීමට කටයුතු කරන ලෙස දන්වමි. (අදාල ආකෘති පත්‍ර ඇමුණුම් අංක 03.1 , 03.2 හා 03.3 මගින් මේ සමඟ ඉදිරිපත් කරමි.)

12. ව්‍යාපෘතිලාභියා බැංකු සංගමයේ සාමාජිකත්වය ගෙන තිබිය යුතුය. එහිදී රු. 500/= ක කොටසක්වත් ලබාගෙන තිබීම ප්‍රමාණවත් අතර කුඩා කණ්ඩායම් ගත වී සිටීම අනිවාර්ය වේ.

13. ලබාගන්නා ණය මුදලට ප්‍රමාණවත් කණ්ඩායම් ඇප ලබාගත නොහැකි අවස්ථාවක අදාල ගම්මාන සමිතියේ බැංකු සංගම් සාමාජිකයෙකුගේ පුද්ගල ඇපයක් මත ණය නිදහස් කළ හැකිය.

14. මෙම ණය ක්‍රමයේ දී සමෘද්ධි බැංකු සංගම් ණය ක්‍රියාවලියේ දී ක්‍රියාත්මක වන සමූහ හා ණය සංරක්ෂණ ණය වැඩසටහන් ඒ පරිද්දෙන් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා මෙහෙයුම් උපදෙස් 05 , 07 හා ඊට එකතුන්හි සඳහන් උපදෙස් අනුව කටයුතු සිදුකළ යුතුය.

අරමුදල් ලැබීම හා ණය මුදල් සම්බන්ධ ගිණුම් ක්‍රියාවලිය පහත පරිදි වේ.

ජීවනෝපාය සංවර්ධන වක්‍රීය ණය අරමුදල ගොඩනැංවීම.

01. දැනටමත් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන වෙනුවෙන් ප්‍රතිලාභීන්ට ලබාදුන් ණය වලින් අයකර ගැනීමට (පිටහිටි) ඇති ණය ශේෂයන් වල එකතුව හා සාමාජික නොවන ගිණුමෙහි පවතින ශේෂයන් වක්‍රීය අරමුදල් ගිණුමට මාරු කිරීම.

   1.1 ජීවනෝපාය සංවර්ධන වක්‍රීය අරමුදල් වලින් ලබාදුන් ණය වලින් පිටහිටි ණය වල එකතුව.

ලැබිය යුතු ණය - ජීවනෝපාය සංවර්ධන ගිණුම	හර
ජීවනෝපාය සංවර්ධන වක්‍රීය ණය අරමුදල සඳහා ලබාගත් අරමුදල් ගිණුම	බැර

(පොදු ලෙජරයේ වත්කම් යටතේ කේත අංක 3113 යටතේ ලැබිය යුතු ණය ජීවනෝපාය සංවර්ධන ගිණුම හා වගකීම් යටතේ ජීවනෝපාය සංවර්ධන වක්‍රීය ණය අරමුදල සඳහා ලබාගත් අරමුදල ගිණුම කේත අංක 4041 විවෘත කර පවත්වා ගෙන යා යුතුය.)

1.2 සමෘද්ධි ගම් පුබුදු ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ගිණුම හා ජාතික සවිය ගම නැගුම ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති නමින් විවෘත කර පවත්වා ගෙන යන සාමාජික නොවන ගිණුම් වල පවතින තැන්පතු ශේෂයන් ජීවනෝපාය සංවර්ධන වක්‍රීය ණය අරමුදලට මාරු කිරීම.

"සමෘද්ධි ගම්පුබුදු ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති" සාමාජික නොවන ගිණුම	හර
"ජාතික සවිය ගම නැගුම ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති " සාමාජික නොවන ගිණුම	හර
ජීවනෝපාය සංවර්ධන වක්‍රීය ණය අරමුදල සඳහා ලබාගත් අරමුදල් ගිණුම	බැර

02. ජීවනෝපාය සංවර්ධන වක්‍රීය ණය අරමුදලෙහි පවතින අරමුදල් භාවිතා කර ප්‍රතිලාභීන්ට අලුතින් ණය මුදල් නිදහස් කිරීමේ දී

ලැබිය යුතු ණය - ජීවනෝපාය සංවර්ධන ගිණුම	හර
මුදල් / සාමාජික තැන්පත් ගිණුම / ජංගම ගිණුම	බැර

03. ලබාදුන් ණය සඳහා වාරික හා පොළී මුදල් අයකර ගැනීම

අලුතින් ලබාදුන් ණය මුදල් සඳහා මෙන් ම මේ දක්වා නකුත් කර පිටහිටි ණය මුදල් වලින් මාසිකව අය කරන වාරික හා පොළිය සඳහා පහත ගිණුම් සටහන් තැබීම කළ යුතුය.

මුදල් / සාමාජික තැන්පත් ගිණුම	හර
ලැබිය යුතු ණය - ජීවනෝපාය සංවර්ධන ගිණුම (වාරිකය)	බැර
ලද ආදායම් - විශේෂ ව්‍යාපෘති ඉපැයීම් ගිණුම (කේත අංක 1013) (පොළී මුදල)	බැර

04. ණය මුදල් පැහැර හැරීම් සිදුවන අවස්ථාවකදී

හිතා මතා ණය මුදලක් පැහැර හැරිය හොත් මෙහෙයුම් උපදෙස් 04 හා ඊට එකතුන්හි පරිදි ණය මුදල අයකර ගැනීම හෝ හිලව් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. එසේ කිරීමෙන් අනතුරුව ශේෂයන් පවතින විටෙක පමණක් පහත පරිදි බොල් ණය ගිණුමට මාරු කිරීම සිදු කළ යුතුය. ඒ සඳහා ගිණුම් ප්‍රවේශන පහත පරිදි වේ.

බොල් ණය ගිණුම - ජීවනෝපාය සංවර්ධන	හර
ලැබිය යුතු ණය - ජීවනෝපාය සංවර්ධන ගිණුම	බැර

(පොදු ලෙජරයේ බොල් ණය ගිණුම - ජීවනෝපාය සංවර්ධන ගිණුම නමින් අලුතින් කේත අංක 3216 යටතේ ගිණුමක් විවෘත කළ යුතුය.)

වැය ගිණුම - බොල් ණය වෙන් කිරීමේ ගිණුම	හර
බොල් ණය සංචිත වෙන් කිරීමේ ගිණුම	හර

- ඉදිරි දිනක බොල් ණය ආපසු අයකර ගැනීමේ දී දැනට සමෘද්ධි බැංකු ණය වැඩසටහන් වලදී ක්‍රියා කරන පිළිවෙත අනුව ගණුම් කටයුතු තැබීමට ද උපදෙස් ලබා දෙන්නෙමු.

05. ණය සංරක්ෂණ අරමුදලට දායක වීම හා ප්‍රතිලාභ ලබාගැනීම

මේ සඳහා මෙහෙයුම් උපදෙස් 05 හා ඊට එකතුන්හි පරිදි බැංකු සංගමය විසින් කටයුතු කළ යුතුය. නව උපදෙස් ලැබීමට පෙරාතුව ලබාදුන් ණය සඳහා ණය සංරක්ෂණ අරමුදලට දායක වී නොමැති හෙයින් ස්වභාවික හේතුන් මත ණය පැහැර හැරීම් වලට ප්‍රතිලාභ ඉල්ලුම් කිරීමට නොහැකිවේ.

06. ප්‍රගති වාර්තා එවීම

සමෘද්ධි බැංකු සංගම් මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම හා එවීම සම්බන්ධ උපදෙස් මෙම ණය වැඩසටහනටද එපරිද්දෙන් වලංගු වේ.

07. ලෙජර් , රෙජිස්තර නඩත්තු කිරීම.

සමෘද්ධි බැංකු සංගම් ණය වැඩසටහන සඳහා ලබාදී ඇති උපදෙස් පරිදි පුද්ගලික ලෙජර් , පාලන ලෙජර් , පාස් පොත් , රෙජිස්තර නඩත්තු කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය කරන ලිපි ද්‍රව්‍ය බැංකු සංගම් වියදමින් මිලදී ගත යුතුය. වාර්තා කිරීම හා නඩත්තුව පහසු කිරීම සඳහා වසම් මට්ටමින් හා ණය ලබාදුන් ව්‍යාපෘති (කෘෂි , සත්ත්ව පාලන හා ධීවර , කර්මාන්ත සහ අලෙවි හා සේවා) අනුව පුද්ගලික ණය ලෙජර් ගොනු කළ යුතුය.

ගිණුම් සඳහා පොදු උපදෙස්

1. මෙම අරමුදල මගින් ණය ලබාදීමේ දී **පිටිහිටි ණය ශේෂය කිසි විටෙකත් ජීවනෝපාය වක්‍රීය අරමුදල් ගිණුමේ ශේෂය ඉක්මවා යා නොහැක.**
2. ණය අනුමත කිරීම , සමෘද්ධි බැංකු ණය වැඩසටහනේ පරිදි මහා සංගම් කළමණාකාර අධ්‍යක්ෂගේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව පාලක මණ්ඩලයට යොමු කර අනුමැතිය ලබාගැනීම බැංකු සංගමය විසින් සිදුකළ යුතුය.
3. මාසිකව ශේෂ පරක්සුමක් ලබාගෙන පොදු ලෙජරයේ පාලන ගිණුම හා තුලනය කළ යුතුය.
4. බැංකු මූල්‍ය අංශය මගින් ලබාද ඇති මෙහෙයුම් උපදෙස් අංක 04 හා ඊට කරන ලද එකතුන් අනුව ණය අනුමත කිරීම , ලේඛණ පවත්වා ගෙන යාම , ණය පසුවිපරම් කටයුතු සිදු කළ යුතු වේ.
5. මෙහෙයුම් උපදෙස් චක්‍රලේඛ ලිපි අංක 38 ට ඊට එකතුන්හි උපදෙස් අවලංගු වන අතර , මින් ඉදිරියට ජීවනෝපාය සංවර්ධන වක්‍රීය ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට වලංගු උපදෙස් මෙමගින් ලබාදෙනු ලැබේ.

භාණ්ඩාගාර ප්‍රතිපාදන වලට අමතරව මෙම වක්‍රීය අරමුදල් යොදවා ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔබගේ අදාල නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබාදෙන මෙන් කාරුණික ඉල්ලමි.

එම්. නඩේෂරාජා	කේ. කේ. එල්. චන්ද්‍රතිලක
අධ්‍යක්ෂ (කර්මාන්ත හා ව්‍යාපාර)	නියෝජ්‍ය අධ්‍යක්ෂ (බැංකු මූල්‍ය)

පිටපත් :- 1. අභ්‍යන්තර විගණක - අ. ක.ස.
2. සියලුම අංශ ප්‍රධානීන් - අ. ක.ස.

කාර්යාලීය ප්‍රර යෝජනය පිණිසයි.		අයදුම්පත් අංකය:-20..... /.....	
ලද දිනය:-	ණය වාරිකය:-	වාරිකය අය විය යුතු දිනය:-	ණය ගිවිසුම් අංකය:-
මුදාහල දිනය:-			
			ණය වර්ගය:-

ජීවනෝපාය වක්‍රී ය අරමුදල් ණය අයදුම් පත්‍ර ය

1. අයදුම්කරු / පිළිබඳ විස්තර

i. මුලකුරු සමඟ නම:- ..... මයා / මිය/මෙනවිය

ii. මුලකුරු වලින් හැඳින්වෙන නම:-.....

iii. ලිපිනය:- .....

.....

iv. වයස අවුරුදු:..... ජා.හැ.අ. | | | | | | | | | | |

v. යැපෙන්නන් ගණන:-.....

vi. සාමාජික අංකය:-.....

vii. සමෘද්ධි සහනාධාර ලබනවාද:- ඔව් / නැත

2. ඉල්ලුම් කරණ ණය මුදල පිළිබඳ විස්තර

i. බැංකු සංගමයෙන් ලබාගෙන ගෙවා අවසන් ණය:- ගණන:-.....
මුදලරු.:-.....

ii. දැනටමත් ගෙවමින් පවතින ණය පිළිබඳ විස්තර:-.....

iii. ඉල්ලුම් කරන ණය මුදල අකුරින් රුපියල්..... පමණි.

iv. ණය මුදල යොදවන ව්‍යාලපෘතියේ නම කුමක්ද.....

v. ණය මුදල ආපසු ගෙවීම මාසික වාරික:-.....

3. ව්‍යාආපෘතිය පිළිබඳ විස්තර:- අළුතින් ආරම්භ කරන [redacted] පවත්වාගෙන යන [redacted]
දැනට පවත්වාගෙන යන්නේ නම්,

i. ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය / පිහිටීම:-.....

ii. දැනටමත් යොදා ඇති මුදල් වටිනාකම:-.....

iii. අයිතියේ ස්වභාවය:- තනි/හවුල්/බදු/කුලී/වෙනත්.....

iv. ලියාපදිංචි අංකය (ඇත්නම්):-..... දිනය :-.....

v. දැනටමත් යොදා ඇති මුදල් වටිනාකම:- රු. .....

vi. දැනට ලබන කන්න/මාසික/වාර්ෂික ආදායම් රු. .....

vii. දැනටමත් දරණ කන්න /මාසික/වාර්ෂිකවියදම රු. .....

viii. ශුද්ධ ආදායම් එකතුව (vi සහ vii අතර වෙනස) රු. | |

4.i ව්‍යාපෘතියට අවශ්‍ය අරමුදල් යෙදවීම පිළිබඳ විස්තර

1. ..... සඳහා රු. .....

2. ..... රු. .....

3. ..... රු.....

4. ..... රු.....

මුළු වියදම් එකතුව රු.....

4.ii ඉතිරි මුදල් සපයා ගන්නා ආකාරය (ණය මුදල ප්‍ර.මාණවත් නොවේ නම්)

.....

4.iii මුදල් යෙදවීමෙන් පසු ව්‍යා.පෘතියෙන් ආපේක්ෂිත ආදායම(මාසික/කන්න/වාර්ෂික) රු.....

5. ණය මුදල ගෙවීම පිළිබඳ විස්තර

5.i. ව්‍යාගපෘතියෙන් ආපේක්ෂිත ආදායම මාසික /කන්න රු. .....

5.ii. වෙනත් මාසික ආදායම් රු. .....

එකතුව රු. .....

5.iii. මාසික වියදම් (ව්‍යා.පෘතිය සඳහා) රු. .....

පවුලේ වියදම රු. .....

වෙනත් රු. .....

එකතුව රු. .....

5.iv මාසික වාරිකයේ වටිනාකම රු. .....

5.v. ව්‍යාරපාරය අසාර්ථක වුවහොත් විකල්ප ණය ගෙවීමේ හැකියාව .....

.....

6. ඇපකරු / ඇපකරුවන් පිළිබඳ විස්තර

සාමාජික අංකය	සම්පූර්ණ නම	ජා.හැ.අ.										ලබාගත් ණය	
												ඇත	නැත

7.සහතිකය

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය. හා නිවැරදි බව ප්‍රිකාශ කරමි. මා විසින් බැංකු සංගමයෙන් ලබා ගන්නා ණය මුදලට යථෝක්ත බැංකු සංගමය විසින් නියම කරනු ලබන පොළිය හා ණය වාරිකය ඇතුලත් මාසික වාරික වලින් නියමිත කාලය තුල ගෙවා අවසන් කරන බවට ස්ථිරවම සහතික වෙමි. එසේ කිරීමට අපොහොසත් වුවහොත් අපට විරුද්ධව නිත්‍යානුකූලව පියවර ගැනීමට සමෘද්ධි බැංකු සංගමයට ඇති අයිතිය පිළිගනිමි.

දිනය:-..... ණය අයදුම්කරුගේ අත්සන:-.....

8. ණය මුදල නිර්දේශ කිරීම

ස.බැ.ස. කළමණාකරු මඟින් පාලක මණ්ඩල ගරු සභාපති වෙත.

8. i මෙම ණය අයදුම් පත්‍රමය පිළිබඳව 20...../...../..... දිනැති සමිති රැස්වීමේදී සාකච්ඡාකර අනුමැතිය ලබාගත් / නොගත් බවත් රු. ..... (අකුරින්) ක ණය මුදල ලබාදීම සුදුසු/නුසුදුසු බවත් සහතික කරමි.

....

දිනය සාමාජික අංකය නම (ගරු සභාපති/ලේකම්) අත්සන (ගරු සභාපති /ලේකම්) නිල මුද්‍ර.ව

8. ii මෙම ණය අයදුම්කරුගේ යෝජිත ව්‍යා.පෘතිය මා විසින් 20..... /...../..... දින පෞද්ගලිකව පරීක්ෂා කරන ලද බවත්, අයදුම්කරුට ණය මුදල ලබා ගැනීමට අවශ්‍යම සුදුසුකම් සියල්ල සපුරා ඇති / නැති බවත් ඒ අනුව රු. ..... ක ණය මුදල ලබා දීම සුදුසු / නුසුදුසු බව නිර්දේශ කරමි. ඒ සමඟ ණය මුදල මුදාහල පසු ව්‍යා.පෘතිය නිරන්තරයෙන් පසු විපරම් කිරීමට හා ණය මුදල ආපසු අය කර ගැනීමට සටහන් කර ගතිමි.

සටහන්:-

.....

.....

....

දිනය නම අත්සන

සමෘද්ධිසංවර්ධන නිලධාරී

නිල මුද්‍රාරව

8.iii කලාප/ ව්‍යා පෘති සහකාර/ ව්‍යා.පෘති කළමණාකරු සටහන්

.....

.....

.....

.....

.....

....

දිනය නම අත්සන නිල මුද්‍රා.ව

8.iv. මා විසින් ක්ෂෙත්‍රම පරීක්ෂණයෙන් ලත් තොරතුරු /බැංකු සංගම් පොත් පත් හා ඉහත නිර්දේශ සලකා බැලීමෙන් අනතුරුව රු. ..... ක ණය මුදලක් ලබා දීම නිර්දේශ කරමි. අයදුම්කරු විසින් සපුරාලිය යුතු ණය කොන්දේසි සපුරා නොමැති බැවින් /කුඩා කණ්ඩායම් /සමෘද්ධි සමිතියෙහි ණය අයවීම සතුටුදායක අයුරින් සිදු නොවන බැවින් ඉහත ණය මුදල නිර්දේශ නොකරමි.

සටහන්:.....

.....

.....

.....

.....

....

දිනය කළමණාකරුගේ නම අත්සන නිල මුද්‍රා.ව

8.v. ඉහත නිර්දේශයන් සැලකිල්ලට ගෙන 20..... /...../..... දින .....
..... ස්ථානයේදී පවත්වන ලද පාලක මණ්ඩල රැස්වීමේදී තිරණ අංක
..... යටතේ රු. ..... (අකුරින්) ක ණය මුදලක්
පමණක් නිත්යා.කූල ලෙස බැංකු සංගමයෙන් මුදාහැරීම අනුමත කරමි/නොකරමි.

සටහන්:.....
.....
.....
.....
.....

....

දිනය ගරු සභාපති (නම) අත්සන නිල මුද්රා.ව

(අනවශ්ය. වචන කපා හරින්න)

<u>සමෘද්ධි බැංකු සංගම් හා ව්යාපෘතිලාභියා අතර ඇති කරනු ලබන ණය ගිවිසුම් පත්ර.ය</u>

<u>ණය මුදල...../-</u>

මෙහි පහත පලමු පක්ෂය යැයි කියනු ලබන ශ්රී. ලංකා ප්රජාතාන්ත්රිතක සමාජවාදී ජනරජයේ 1993 අංක 30 දරණ සමෘද්ධි අධිකාරී පනතට අනුව ව්යවස්ථාපිත ශ්රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්යක්ෂ ජනරාල් (මින් මතු අධ්යක්ෂ ජනරාල් වශයෙන් හැඳින්වෙන) වෙනුවෙන් ශ්රීධ ලංකා සමෘද්ධි අධිකාරියට අනුබද්ධ.....සමෘද්ධි බැංකු සංගමයේ කළමණාකරු (මින් මතු පලමු පාර්ශවය යැයි හැඳින්වෙන එක් පක්ෂයකටද,

මෙහි දෙවන පාර්ශවය යැයි කියනු ලබන ණයලාභියා වන (මෙය මින් මතු දෙවන පාර්ශවය ලෙස හැඳින්වෙන)පලමු පාර්ශවයේ කොටස් ප්රාග්ධන ගිණුම් අංක .....දරණ.....හිපදිංචි.....(ජා.හැ.අං.....) යන එකී ණයලාභිගේ (මෙහි පහත සඳහන් කාරණා වලදී / වගකීම්වලදී හා අදහස් වන තැන්වලදී එකී ණයලාභියාගේ උරුමකරුවන් ,පොල්ම:කරුවන්, අද්මිනිස්ත්රාත්කරුවන්පැවරුම්කරුවන්ද ඇතුලත් වන්නේය යන අදහස තේරුම් ගැනීම හා ඒත්තු ගැනීම ඇතිව) එක් පක්ෂයකට බැඳී වර්ෂ ..... ක්වූ ..... මස.....දින.....හිදී.

එකී කොන්දේසි කවරේද යත්,

1) ඉහත කී ගිවිසුම දිවිනැගුම ජාතික වැඩසටහනට සමගාමීව ජීවනෝපාය වක්රී.ය අරමුදල මගින් ක්රි)යාත්මක කිරීමට දෙපාර්ශවය එකග වේ

2)ඉහතකී ගිවිසුම ප්රමකාරව පලමු පාර්ශවය විසින් දෙවන පාර්ශවය වන.....ලිපිනය.....අංක හි පදිංචි .....අය වෙත පලමු පාර්ශවයේ පාලක මණ්ඩල තීරණ අංක .....යටතේ අනුමත කර ඇති ශ්රී ලංකාවේ වලංගු මුදලින් රු . .....(.....) ක මුදලක් සියයට (.....) ක්වූ වාර්ෂික පොලී අනුපාතයක් යටතේ මාසික වාරික.....කදී ගෙවා අවසන් කිරීමට දෙපාර්ශවය එකග වේ.

3) ඉහත කී ගිවිසුම ප්ර.කාරව පලමු පාර්ශවය විසින් මාස 3ක සහන කාලයක් දෙවන පාර්ශවය වෙත ලබාදීමට එකග වේ.

4) නොසැලකිලිමත් ලෙස මෙම ව්යාකපෘතිය සඳහා යම් අලාභහානියක් සිදු වුව හොත් හෝ ව්යාපපෘතිය අසාර්ථක වුවහොත් එම අවස්ථාවේ කරනු ලබන තක්සේරු වටිනාකමට සමාන මුදලක් දෙවන පාර්ශවය විසින් පලමු පාර්ශවයට ගෙවීමට ගිවිසුම් ප්රසකාර බැඳී සිටී

5) ව්යාශපාර හෝ ඒ හා සම්බන්ධිත තොරතුරු පලමු පාර්ශවය ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවකදී පලමු පාර්ශවයේ නියෝජිතයාට ලබා දීමට දෙවන පාර්ශවය ගිවිසුමෙන් බැඳී සිටින බවත් ,තෙවැනි පාර්ශවයක් වෙත එම තොරතුරු ලබා දීමේ අයිතිය පලමු පාර්ශවය වෙත සතුවන බව දෙවන පාර්ශවය පිලිගනී.

6) ඉහත ගිවිසුම ප්රේකාරව ණය දෙනු ලබන මුදල ආපසු ගෙවීමේදී දෙවනපාර්ශවය ගිවිසුමේ සඳහන් කොන්දේසි වලට පටහැනිව කටයුතු කරන අවස්ථා වලදී එකී ණය මුදල එකවර අය කර ගත හැකි බව දෙපාර්ශවයම පිලිගනී.

7) ඉහත කී ගිවිසුමේ 6 වන කොන්දේසි ප්‍රරකාරව එකී ණය මුදල එකවර අයකර ගැනීමේදී දෙවන පාර්ශවය සතු යථෝක්ත බැංකු සංගමයේ ඔවුන් නමින් වෙනත් මූල්‍ය ආයතනයක පවත්වා ගෙන යනු ලබන ගිණුමක පවතින මුදලින් ද ඔවුන් සතු ස්ථාවර වත්කමක් හෝ ජංගම වත්කමක් පලමු පාර්ශවය භාරයට ගැනීමට ,විකිණීම,කුළියට දීම හෝ වෙනත් අභිමත ක්‍රියාමාර්ගයකින් ණය මුදල පියවා ගැනීමට හැකි බව දෙපාර්ශවයම පිළිගනී.

8) ඉහත කී ගිවිසුමේ 6 වන කොන්දේසිය ප්‍රරෙකාරව ණය මුදල පියවා ගැනීමට බලය ඇති බව දෙපාර්ශවය පිළිගනී.

9) ඉහත කී ගිවිසුමේ 7 වන කොන්දේසිය ප්‍රරෙකාරව එකී බලය පලමු පාර්ශවය වෙත සම්පූර්ණ ණය මුදල ගෙවා අවසන් කිරීමෙන් පසුව අවසන් වන බව දෙපාර්ශවය පිළිගනී.

10) ඉහත කී ගිවිසුම ප්‍ර කාරව ව්‍යාළපෘති පසු විපරම් කිරීමේදී පලමු පාර්ශවය වෙත පහසුවෙන් නිරීක්ෂණය කල හැකි වන අයුරින් ආපසු ගෙවීම් සිදු කිරීම සම්බන්ධ තොරතුරු ලග තබා ගැනීමටත් පලමු පාර්ශවය විසින් වාරික අය කර ගත් බවට එහි අනු අත්සන් යොදා ගැනීමට දෙවන පාර්ශවය එකග වේ.

11) ඉහත කී ගිවිසුම ප්‍රිකාරව නියමිත අයුරින් වාරික නොගෙවන්නේ නම් ඒ සඳහා වාරිකයකට1% ක දඩ පොලියක් අයකරන බව දෙපාර්ශවය පිළිගනී.

12) උක්ත දෙපාර්ශවයෙන් යම් පාර්ශවයක් විසින් මෙකී ගිවිසුමේ කොන්දේසි කඩ කරන්නේ නම් එම පාර්ශවයට විරුද්ධව නීති මගින් කටයුතු කිරීමට හැකි බව දෙපාර්ශවය පිළිගනී.

ඊට සාක්ෂි පිණිස ඉහත කී ගිවිසුමට පලමු පාර්ශවය වෙනුවෙන් සමෘද්ධි කළමණාකරු.....වන මමද , දෙවන පාර්ශවය වෙනුවෙන්..... , ...වන මමද වර්ෂ .....ක්වූ.....මස.....දින.....හිදී අත්සන් තැබුවෙමු.

පලමු පාර්ශවය දෙවන පාර්ශවය

....

සමෘද්ධි කළමණාකරු ණයකරු ගේ අත්සන

සාක්ෂි :-

1) 1)

2) 2)

ණය මුදල / ණය මුදලේ කිසියම් ශේෂයක් ගෙවීමට කැමැත්ත පලකරමින් ඇපකරු විසින් කරනු ලබන ප්‍රඥකාශය

.....

.....හි පදිංචි .....

(ජා.හැ.අ. .....) යන පළමු පාර්ශ්වගෙන් ලබාගන්නා ණය මුදල සඳහා මෙම ඇපය අඛණ්ඩ ඇපයක් බවත්, ඇපය වෙනුවෙන් මා/අප එක්ව හා වෙන් වෙන්ව බැඳී සිටිමි. මා/අප සතු සියළු අයිතිවාසිකම් මෙයින් අතහැර දමන අතර, මෙම ණය මුදලට වූ ඇපය වෙනුවෙන් මා/අප නමින් බැංකු සංගමයේ ඇති ඕනෑම මුදලක් හිලව් කිරීමට / විසර්ජනය කිරීමට බැංකු සංගමයට බලය පවරා දෙමි/දෙමු.

1. ඇපකරු අත්සන :.....
   සම්පූර්ණ නම :.....
   ලිපිනය :.....
   ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

2. ඇපකරු අත්සන :.....
   සම්පූර්ණ නම :.....
   ලිපිනය :.....
   ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

3. ඇපකරු අත්සන :.....
   සම්පූර්ණ නම :.....
   ලිපිනය :.....
   ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

4. ඇපකරු අත්සන :.....
   සම්පූර්ණ නම :.....
   ලිපිනය :.....
   ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

1. සාක්ෂිකරුගේ අත්සන :.....
   සම්පූර්ණ නම :.....
   ලිපිනය :.....
   ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

2. සාක්ෂිකරුගේ අත්සන :.....
   සම්පූර්ණ නම :.....
   ලිපිනය :.....
   ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | |

මීට සාක්ෂි වශයෙන් ..... ක් වූ ..... මස ..... වැනි දින .....
..... දී අප විසින් අත්සන් තබන ලදී.

කාර්යාලීය ප්‍ර.යෝජනය පිණිසයි

1. ණය මුදල මුදා හැරීමට පෙර නිසි පරිදි ණය ගිවිසුම සම්පූර්ණ කර අදාල ණය නිසි පරිදි අත්සන් කර ඇති බවට සමෘද්ධි බැංකු කළමණාකරු සහ සහකාර කළමණාකරු සෑහීමකට පත්වය යුතුයි.

2. මෙම ගිවිසුම සහ ණය ඉල්ලුම් පත්‍රමය බැංකුවේ සුරැකුම් ලියවිල්ලක් බවට පත්වේ. එබැවින් ඉතාම ප්‍රැවේසම් ලෙස අදාල සමෘද්ධි බැංකු මෙහෙයුම් පත්‍රිරකා අංක 4 හි සඳහන් උපදෙස් පරිදි ද්විත්ව පාලනයට යටත් කල සේප්පුවේ හෝ කැබිනෙට්ටුවේ තැබිය යුතුයි.

3. එසේ තැබීමට පෙර පහත සඳහන් කරුණු සම්පූර්ණ කල බවට ඒ ඒ නිලධාරීන් අත්සන් කල යුතුය.

කාර්යය	ඉටු කල බවට (√) යොදන්න	ගිණුම් ලිපිකරු අත්සන	සහකාර කළමණාකරු අත්සන	කළමණාකරු අත්සන
1. ලියවිලි නිසි ලෙස සම්පර්ණ කර ඇති බවට පරීක්ෂා කළා.				
2. පාලක මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.				
3. ණය මුදල මුදා හැරීම.				
4. ණය මුදල මුදා හැරීමෙන් පසු ගිණුම් තැබුවා				
5. ණය වාරිකය අයකර ගැනීම සඳහා භාවිතා කරන ණය කාඩ්පත පිළියෙල කලා				

අභ්‍යතන්තර විගණන නිලධාරියාගේ ප්‍රර්යෝජනය පිණිස

ලියවිලි පරීක්ෂා කල බව සහ අඩුපාඩු සකස් කිරීම සඳහා අදාල කරුණු මෙහි සටහන් කර අත්සන් තබන්න.

.....